මාධ්‍යයක් මගින් යම් කිසි තොරතුරක් හෝ ඡායාරූපයක් සිතාමතාම විකෘති කොට ප්‍රකාශයට පත් කිරීම බරපතල මාධ්‍ය ආචාර ධාර්මික උල්ලංඝනයක් වනවා මෙන්ම, පුවත්පතක පළවූ යම් කිසි පුවත් වාර්තාවක්, ලිපියක් හෝ ඡායාරූපයක් විකෘති කොට බෙදාගැනීමද සදාචාරාත්මක වරදක් ලෙසින් දැකිය හැක.

"අද" පුවත්පතේ (11/25) "බදුල්ල පොලීසියේ නිලධාරීන් හයදෙනෙකු ස්වයං නිරෝධායනයට" යනුවෙන් දැක්වුණු ප්‍රවෘත්තියේ සිරස්තලය විකෘති කොට, සමාජ මාධ්‍ය තුළ සංසරණය වූ පුවත් වාර්තාව ඊට උදාහරණයක් ලෙසින් දැක්විය හැක.

මෙහිදී පැවසිය යුතු වන්නේ, පුවත්පත් ඇතුළු මාධ්‍ය ආචාර ධාර්මික ප්‍රවේශයකින් කටයුතු කිරීම බලාපොරොත්තු වන්නා සේම, නිවැරදිව පළවී ඇති අන්තර්ගතයන් විකෘති කොට නැවත බෙදාගැනීම වැනි ආචාර ධාර්මික නොවන ක්‍රියාවන්ගෙන් වැළකීමට පාඨකයන්/ප්‍රේක්ෂකයන් වන අපද සැලකිලිමත් විය යුතු බවයි. ආචාර ධාර්මිකව මාධ්‍ය භාවිතා කිරීම නම් එයයි.

මේ පිළිබඳව ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයෙන් සිදුකළ කරුණු විමසීමට ප්‍රවේශය මෙතැනින්: https://www.facebook.com/374468782625364/posts/4786021091470089/

#MediaEthicsSL #lka #SinhalaPress #Ada
— with Sri Lanka Press Institute.